**ශීර්ෂය - 244 - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමණාකරනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 5 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා රු. 10,250,000 ක අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුල උපයෝජනය කල පසු රු. 4,390,893 ක් ඉතිරි වී ඇති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 54 අතර පරාසයක් ගෙන තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි.<br><br>2401 යටතේ වූ රු. 500,000 ක් ප්‍රායෝගික පුහුණු වැඩසටනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වෙන් කර ගත් අතර කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් නොපවත්වන ලදි. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කළයුතු වීම |

**2.2 බැරකම් හා බැඳීම්වලට එලඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව නිකුත් කර තිබූ මාර්ගෝපදේශ 3:4 ට පටහැනිව භාණ්ඩාගාරය වෙත වාර්තා කර නොතිබූ රු. 65,299 ක් වටිනාකම් වූ බැරකම් 2021 වර්ෂය තුළදී නිරවුල් කර තිබුණි. | එම වැය විෂයය යටතේ 2020 වර්ෂය වෙනුවෙන් 2021 පෙබරවාරි මස රු. 40,103ක් ගෙවා ඇත. එය රියදුරු මහතුන් විසින් අනුමත අතිකාල පැය ගණනට අමතරව අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් ගෙවන ලද අතිකාල දීමනා වේ. එසේම 1101 වැය විෂයය යටතේ 2020 වර්ෂය වෙනුවෙන් ගෙවා ඇති රු.4,250 ක මුදල රියදුරු මහතුන්ගේ සංයුක්ත | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

|  |  |  |
| --- | --- | --- |
|  | දීමනා ගෙවීම් සඳහා වන අතර අදාල ඉල්ලීම් 2021 ජනවාරි මසදී ඉදිරිපත් කර ඇත. එබැවින් එම වටිනාකම 2020 වර්ෂයෙහි බැදීම් ලෙස දක්වා නොමැත. |  |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1. සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම, ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරි වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කර වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වයේ පවතින BIMSTEC හා SAFTA යන ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් 02 කට අදාලව මූල්‍යමය හෝ භෞතික ප්‍රගතියක් ලබාකර | SAFTA සහ BIMSTEC ගිවිසුම්වලට අදාළව 2020 වසර සඳහා සැලසුම් කර තිබූ වැඩසටහන් කීපයක් කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් | වෙළඳ ගිවිසුම් මඟින් මූල්‍යමය හා භෞතික ප්‍රගතීන් ලබාකර ගැනීමට කටයුතු කලයුතු වීම |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | කල් තැබීමට සිදුවූ බව දන්වා ඇත. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල සේවක මණ්ඩල පුහුණු කිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද වර්ෂය තුල කිසිදු නිලධාරියෙකු පුහුණු අවස්ථාව ලබා දීමට කටයුතු කර නොතිබුණි . | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම පුහුණු වැඩසටහන පැවැත්වීමට නොහැකි විය. | නිලධාරීන් සඳහා පුහුණු කටයුතු ලබාදීමට කටයුතු කලයුත වීම |

**4. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

---------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව තුල අනුමත තනතුරු 62 ක් පවතින අතර තථ්‍ය කාර්යමණ්ඩලය අනුයුක්ත කර ඇත්තේ තනතුරු 53 ක් සඳහා පමණක් වේ. තනතුරු 09 ක පුරප්පාඩු පවතින අතර එය අනුමත කාර්යමණ්ඩලයේ සියයට 15 ක ප්‍රතිශතයක් විය. ඒ තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන මෙන් මුදල් අමාත්‍යාංශයෙන් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර ඇත. ප්‍රාථමික ද්විතීයික හා තෘතීයික මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට විටින් විට කටයුතු කළද රේගු දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් අංශ වෙත සිදුකල අභ්‍යන්තර ස්ථානමාරු කිරීම් නිසා නැවත පුරප්පාඩු ඇති විය. | සේවා අවශ්‍යතා පදනම් කරගෙන දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම |